# චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යයේ සන්නිවේදන ශක්‍යතා

## (සද්ධර්ම රත්නාවලිය ගද්‍ය ග්‍රන්ථයට විශේෂිතව සිදුකළ අධ්‍යයනයකි)

**CITATION** - Nandasiri, Amali Uthpala. (2012). Communication Competencies of Traditional Sinhala Literature.' Specifically 'Saddharma Rathnawaliya and Buthsarana' - Dissertation, Faculty of Social Sciences, Depatment of Mass Communicatio. University of Kelaniya.

**Abstract**

සන්නිවේදන මාධ්‍යයක් ලෙස සාහිත්‍යයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. පුද්ගල ජීවිතය යහපත්ව පවත්වාගැනීමට අවශ්‍ය දැනුම, තොරතුරු, රසවින්දනය, නව සංකල්පනා හා විචාරශීලීත්වය එමඟින් ලබාදෙයි. පොදු ජනතාව කේන්ද්‍ර කරගනිමින් ග්‍රන්ථ රචනා කිරීමේ දී සාහිත්‍ය සන්නිවේදනයේ අරමුණු බහුවිධ ක්ෂේත්‍රයක පැතිර පවතියි. මේ නිසා සාහිත්‍ය කෘති රචනා කිරීමේ දී නිර්මාණශීලි සන්නිවේදන ශක්‍යතා භාවිතය වැදගත් වේ.

සාර්ථක සන්නිවේදනයක් උදෙසා චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යයෙන් පිළිබිඹු කෙරෙන සන්නිවේදන ශක්‍යතා විමසා බැලීම මෙම පරියේෂණය මඟින් සිදුකෙරිණි. ලාංකේය චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍ය මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ ක්ෂේත්‍රය යි. දඹදෙණි යුගයට අයත් සද්ධර්ම රත්නාවලිය ගද්‍ය ග්‍රන්ථයට විශේෂිතව පර්යේෂණය සිදුකෙරිණි. දත්ත රැස්කිරීම සඳහා භාවිත ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය වූයේ අන්තර්ගත විශ්ලේෂණය යි. ගද්‍ය රචනා ක්‍රමවේදය, කථා වින්‍යාසය, භාෂා ප්‍රයෝග භාවිතය, නිරූපණ හැකියාවන්, සමකාලීන සමාජ ව්‍යුහයේ පැතිකඩ පිළිඹිබු කිරීම මෙන් ම පුද්ගල පෞරුෂ වර්ධනය සඳහා දක්වන දායකත්වය යන ප්‍රධාන කරුණු යටතේ දත්ත විශ්ලේෂණය කෙරිණි.

චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍ය මඟින් නිර්මාණශීලි සන්නිවේදන ශක්‍යතා පිළිබිඹු කරන බව අධ්‍යයනයෙන් අනාවරණය විය. එහිදී සාහිත්‍ය නිර්මාණය සඳහා මූලික පදනම වී ඇත්තේ ආගමික චින්තනය යි. සමකාලීන සමාජ පසුබිමට අනුරූපව, ග්‍රාහක විඥ්ඥාණය අවබෝධ කරගත් කතා කලාවක් හා භාෂා ක්‍රමවේදයක් ගද්‍ය කෘති තුළ භාවිතකර ඇති බව අධ්‍යයනයෙන් පැහැදිලි විය. සමාජ පසුබිම අනුරූපව සිදුකළ නිර්මාණාත්මක භාෂා භාවිතයේ සාර්ථකත්වය හේතුවෙන් මෙම ගද්‍ය කෘතිය ග්‍රාහක විචාරශීත්වය අවධි කරන්නා වූ සන්නිවේදන මාධ්‍යයක් ලෙස හඳුනාගත හැකි ය.

මේ අනුව මනෝවිද්‍යාත්මක, සමාජවිද්‍යාත්මක, මානවවිද්‍යාත්මක හා ආචාරවිද්‍යාත්මක ආදී ක්ෂේත්‍ර ගණනාවක් සඳහා වැදගත් වන සන්නිවේදන ශක්‍යතා රැසකින් චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍ය සමන්විත බව පැහැදිලි විය. චිරන්තන ගද්‍ය සාහිත්‍ය මඟින් පෙන්වාදෙන සර්වකාලීන සමාජ යථාර්ථයන්ගේ ආස්වාදය නූතන සමාජයට විඳගැනීම සඳහා සාහිත්‍ය නව අරුතකින් කියවීම සිදුකළ යුතු ය.

**තාක්ෂණික පද ඃ**

සන්නිවේදන ශක්‍යතා, චිරන්තන ගද්‍ය සාහිත්‍ය, ග්‍රාහක විඥ්ඥාණය, භාෂා ක්‍රමවේද